සේවක අර්ථසාධක අරමුදල

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

2011 දෙසැම්බර් 31 උනට සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වී ඇති රු. 76,304,000 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. මෙම වත්කම් තොගය තළ සියයට 50 බැගින් ක්ෂය කර සම්පූර්ණයෙන්ම අගය හීන වූ මෙතෙක් ප්‍රයෝජනයට නොගත් රු. 18,422,195 ක් වටිනාකමැති පරිගණක උපාංග තොගයක්ද අන්තර්ගත වී තිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

වාහන අළුත්වැඩියා හා යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියා සඳහා වියදම් කළ රු. 987,015 ක් සහ රු. 550,182 ක මුදල ප්‍රාගධන වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

#### 1.2.3 නිරවුල් නොකළ ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සේවක අර්ථසාධක අරමුදලට අදාලව නඩු පැවරීමෙන් හා හිඟ වාරික ලෙස අයකර ගන්නා ලද 2011 දෙසැම්බර් 31 දිනට එක් එක් සාමාජිකයාගේ ගිණුම්වලට බැර කර නිරවුල් නොකල ශේෂය රු. 4,671,769,511 ක් විය.“මූල්‍ය පරිපාලනයේ දුර්වලතාවයක් නොවන ඉහල පහල යාම අපේක්ෂා කළ යුතු මෙම ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට, ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් පවතින බව” මෙයට පිළිතුරු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දන්වා තිබුණ.

**(ආ)** සේවක අර්ථසාධක අරමුදල් ලෙස අර්ථලාභීන්ගේ ගිණුම්වලට බැරකර නිරවුල් නොකළ පොදු තැන්පත් ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 346,697,934 ක් විය.“දැනට හිමිකරුවන් හඳුනාගැනීමේ වේගය වැඩි කිරීමට පරිගණක වැඩසටහනක් හඳුන්වාදීමට ක්‍රියා කරමින් සිටින බැවින් ඉදිරියේ දී මෙම ශේෂය අවම වන බව” මෙයට පිළිතුරු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් දන්වා තිබුණි.

**(ඇ)** අරමුදල ආරම්භයේ සිට වර්ධනයවෙමින් පැවති 2011 දෙසැම්බර් 31 දින වන විට රු. 1,187,649,767 ක් වූ අඩුවැඩි දායක මුදල් ගිණුමේ ශේෂය නිරවුල් නොකිරීම නිසා අරමුදල්ලාභීන්ගේ ප්‍රතිලාභ පමා වීමට හා අහිමි වීමට හේතු වී තිබුණි. “සේව්‍යයන්ගේ ක්‍රියාකලාපය අනුව ඇති වන මෙම ශේෂය නිරවුල් කිරීමට සේවක අර්ථසාධක අරමුදලට පමණක් කළ හැකි දෙයක් නොවන බවද තොරතුරු නිවැරදිව සඳහන් නොකරන සේව්‍යයන්ට දඩුවම් කිරීමේ ක්‍රම වේදයකට පනත සංශෝධනය කිරීමෙන් මේ පිළිබඳව සලකා බැලිය හැකි බව ද, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මෙම ශෂයන් නිරවුල් කිරීමට පවතින සම්පත්වලට යටත්ව හැකි තරම් කටයුතු කරන බවද” මෙයට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දන්වා තිබුණි.

**(ඈ)** 2011 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකල හිමිකම් නොපානා ලද ප්‍රතිලාභ ගිණුමේ හා රඳවාගත් ප්‍රතිලාභ ගිණුමේ ශේෂ පිළිවෙලින් රු. 120,476,638 ක් හා රු. 13,160,611 ක් විය. “ වෙක්පත් කල් ඉකුත්වීම හා ප්‍රතිලාභ ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන බැංකු ගිණුම් තොරතුරු වල වූ සාවද්‍යතා මත ඇති වී තිබෙන හිමිකම් නොපාන ලද ප්‍රතිලාභ ගිණුමේ ශේෂයට අදාල තොරතුරු කම්කරු කොමසාරිස් මගින් නිවැරදි කර ගැනීමෙන් අනතුරුව නැවත ඉක්මණින් ගෙවීම් කිරීමට කටයුතු කරනු ලබන බවද”

“මියගිය සාමාජිකයින්ගේ යැපෙන්නන්ට හිමිකාරත්වය ඇති කම්කරු කොමසාරිස්ගේ නියෝගය මත රඳවාගෙන ඇති, රඳවාගත් ප්‍රතිලාභ ගිණුමේ ශේෂය නැවත කම්කරු කොමසාරිස්ගේ නියෝග ලැබීමෙන් අනතුරුව නිරවුල් කරන බවද, මෙය සේවක අර්ථසාධක අරමුදලේ අභිමතය පරිදි විසඳිය නොහැකි අභ්‍යන්තර මෙහෙයුම් ක්‍රියාවලියේ දෝෂයක් නොවන බවද” මෙයට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දන්වා තිබුණි.

### 1.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

සේවක අර්ථසාධක අරමුදලේ කම්කරු දෙපාර්තමේන්තුවට අයත් රු. 959,246,218 ක ස්ථාවර වත්කම් හා ඊට අදාල රු. 480,309,648 ක සමුච්චිත ක්ෂය සනාථ කෙරෙන විධිමත් සමීක්ෂණ වාර්තා හා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 1.2.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනතේ 03 වගන්තිය | සේවක අර්ථසාධක අරමුදල නියමිත දිනට දායක මුදල් ගෙවීම පැහැර හැරීමේදී අධිභාර අයවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත සමුදාය පද්ධතිය සමග කරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී අරමුදලේ ලි.ප. වී ඇති ආයතන 129 කින් 2009 - 2011 කාල පරිච්ඡේදය වෙනුවෙන් අයවිය යුතු රු. 101,140,260 ක අධිභාර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ද අයකර ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි | |
| මු.රෙ. 1645 (අ) (ආ) හා 1646 | වාහන 39 ක ලොග් සටහන් පොත් නිසි පරිදි නඩත්තු කර නොතිබුණු අතර, දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය | සේවක අර්ථසාධක අරමුදලේ ශ්‍රී ලංකා මහබැංකුවේ නිලධාරීන්ගේ සේවා නියුක්ති ආදායම මත අයකර ගත යුතු රු. 1,395,505 ක උපයන විට ගෙවීම් බදු අදාල නිලධාරීන්ගෙන් අයනොකර අරමුදලින් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු වල ශුද්ධ ප්‍රතිඵලය ආදායම් බදුවලට පසු රු. 107,202,066,499 ක අතිරික්තයක් ව අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය රු. 111,445,011,747 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අතිරික්තයෙහි රු. 4,242,945,248 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි. ආයෝජන ආදායම් රු. 5,049,303,683 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අයත් ක්‍රියාකාරී සේවායෝජක ආයතන7543 ක් අතුරින් ආයතන 2632 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට කම්කරු නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක්කර තිබුණු අතර, ඉතිරි ආයතන 4911 ක් හෙවත් ආයතන සංඛ්‍යාවෙන් සියයට 65 ක් වර්ෂයකට වැඩි කාල පරිච්ඡේදයක් තුළදී කම්කරු නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක් වී නොතිබුණි. "දෙපාර්තමේන්තු චකලේඛ ප්‍රකාරව ක්ෂේත්‍ර රාජකාරි කටයුතු වල නිරත කම්කරු නිලධාරීන් මගින් වසරකට ආයතන 2880 ක් පමණක් පරීක්ෂා කළ හැකි බව ද කම්කරු නීති උල්ලංඝනය කරන ආයතන නිරන්තර පරීක්ෂාවට ලක් කරන බවද" මෙයට පිළිතුරු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් දන්වා තිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදලේ දිස්ත්‍රික කම්කරු කාර්යාල 02 කට අයත් සේවායෝජක ආයතන වලින් අවස්ථා 337 කදී හිඟහිටි දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට ගෙන තිබුණු අධිකරණ ක්‍රියාමාර්ග අතරමඟ නැවතී තිබීම නිසා අළුතින් සාමාජික ගිණුම් වලට බැරවිය යුතු රු. 92,097,672 ක දායක මදල් හා අධිභාර සේවක අර්ථසාධක අරමුදලට අහිමි වී තිබුණි.

(ඇ) මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් සේවායෝජක ආයතන වලින් සේවක අර්ථසාධක අරමුදල වෙත අයවිය යුතු රු. 204,584,371 ක හිඟ දායක මුදල් හා අධිභාර අයකරගැනීම සඳහා ප්‍රථම හා අවසන් නිවේදන යවා දීර්ඝ කාලයක් ගතවී ඇතත්, හිඟ දායක මුදල් අයකර ගැනීමට හෝ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට 2012 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් සේවායෝජක ආයතන 47 කට අදාලව රු. 13,249,417 ක දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට 2012 ජූනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. "කාර්ය මණ්ඩල ඌනතාවයක් පවතින බැවින් කටයුතු කිරීම අපහසු වුවත්, මෙම කටයුතු මාස 06 කින් නිම කිරීමට සැලසුම් කර ඇති බව" මෙයට පිළිතුරු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් දන්වා තිබුණි.

(ඉ) මහනුවර උතුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය බලප්‍රදේශයට අයත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ආයතන 55 කින් වසර 04 ක කාලයක සිට සේවක අර්ථසාධක අරමුදලට අයවිය යුතු දායක මුදල් රු. 44,679,953 ක් හා අධිභාර රු. 14,423,022 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මහනුවර උතුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය බලප්‍රදේශයට අයත් සේවායෝජක ආයතන දෙකකට වරෙන්තු නිකුත් කර තිබුණත්, ඉදිරි කටයුතු ක්‍රියාත්මක නොවීම නිසා මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ අංක 3688 හා 74135 නඩු මගින් අයකර ගතයුතු සේවක අර්ථසාධක අරමුදල් රු. 1,692,078 ක් ( රු. 767,996 ක් හා රු. 924,082 ක් එකතුව) මෙතෙක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. "අංක 3688 දරන ආයතනයේ අයිතිකරු විදේශ ගතවී ඇති බැවින් වරෙන්තු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බවද, අංක 74135 දරන ආයතනය අවුරුදු 13 කට පෙර වසා ඇති බව ද නඩු සඳහා චූදිතයින් ඉදිරිපත් නොවන බැවින් විවෘත වරෙන්තු නිකුත් කර ඇති බව ද" මෙයට පිළිතුරු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් දන්වා තිබුණි.

(උ) මහනුවර දකුණ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් සේවායෝජක ආයතනවල ප්‍රමාණවත්ව අධිකරණයට කරුණු ඉදිරිපත් නොකිරීම, තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙන නොයෑම හා නිසි පරිදි අවධානය යොමු නොකිරීම නිසා කටයුතු අවසන් නොවූ අධිකරණ ක්‍රියාමාර්ග 32 ක් හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල්ලාභීන්ට අහිමි වී තිබුණු මුදල රු. 20,478,379 ක් විය.

(ඌ) මහනුවර දකුණ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ආයතන 22 කින් අධිකරණ කටයුතු ආරම්භ නොකිරීම නිසා 2012 ජූනි 30 දන වන විටත් අයකර නොගත් දායක හා අධිභාර මුදල රු. 143,455,982 ක් විය. මෙසේ නීතිමය ක්‍රියාමාර්ග නොගැනීමට කම්කරු අමාත්‍යාංශය හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය එකඟ වී ඇති බව කම්කරු කොමසාරිස්ගේ 2006 ජූලි 19 දිනැති ලිපියෙන් විගණනයට වාර්තා කර තිබුණි. මෙම එකඟතාවය නිසා 2006 දෙසැම්බර් 31 දිනට මෙම වතු සමාගම් වල සේවකයින්ගේ

පෞද්ගලික වැටුපෙන් අයකර ගෙන තිබුණු රු. 22,853,700 ක මුදලකට පවා ප්‍රතිලාභ අහිමි කර තිබුණු අතර, මේ මගින් අවුරුදු 55 ක් සම්පූර්ණ කරන හා මිය යන සේවකයින්ගේ දායක මුදල් අහිමි කිරීමේ අවධානමකට ද ලක් කර තිබුණි.

(එ) මහනුවර දකුණ ගම්පොල කම්කරු බල ප්‍රදේශයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වත්තක අවසන් නිවේදන යවා මාස 9 සිට 12 ක් අතර කාලයක් ගත වී තිබුණු සේවක අර්ථසාධක අරමුදලට අයවිය යුතු රු. 10,151,794 ක දායක මුදල් ද අධිභාර ලෙස රු. 4,152,001 ක් ද, අම්බුළුවාව ජෛව විවිධත්ව ආයතනයෙන් 2004 වර්ෂයේ සිට කාර්ය මණ්ඩලය 18 කගෙන් අයවිය යුතු දායක මුදල් හා අධිභාර රු. 1,572,120 ක් ද, වශයෙන් එකතුව රු. 15,875,915 ක් 2012 ජූනි 30 දින වනවිටත් අයකරගෙන නොතිබුණි.

(ඒ) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා පෞද්ගලික සමාගමක් සමඟ 2010 නොවැම්බර් 23 දින ගිවිසුමකට එළඹී තිබුණි. 2010 හා 2011 වර්ෂ වලදී පිළිවෙලින් රු. 6,467,403 ක් හා රු. 603,948 ක් ඒ වෙනුවෙන් වියදම් කර තිබුණි. 2012 වර්ෂය අවසන් වන විටත් එම ව්‍යාපෘතියේ කටයුතු නිම කර නොතිබුණු අතර, එම ව්‍යාපෘතිය වෙනුවෙන් මිළදී ගන්නා ලද රු. 7,457,195 ක් වටිනා යන්ත්‍ර ද දෙපාර්තමේන්තුවේ නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඔ) පරිගණක දත්ත සමුදාය අනුව නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ කලාප අංක 6 ට අදාලව ක්‍රියාත්මක තත්ත්වයේ පවතින සේවායෝජක ආයතන 10 කින් වර්ෂ 12 ක පමණ කාලයක සිටද, තවත් ආයතන 09 කින් වර්ෂ 03 සිට 07 දක්වා වූ කාල පරාසයක් තුලදීද, සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් 2012 ජූනි 30 දින වන විටත් අය කර නොතිබුණි.

**3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**3.1 <u>කාර්ය සාධනය</u>**

3.1.1 <u>**මෙහෙයුම් කාර්යසාධනය**</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂය අවසානයේ දී කාර්ය සාධන තත්ත්වය පහත පරිදි විය.

| විස්තරය | තථ්‍ය සංඛ්‍යාව | අරමුදල් ක්‍රියාකාර්ත්වයට අදාල වූ සංඛ්‍යා | එහි ප්‍රතිශතයන් |
|---|---|---|---|
| ---------- | ---------------- | -------------------------- | --------------- |
| | | | % |
| පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවානියුක්තිය | 3,414,944 | 2,300,000 | 67.35 |
| සේවා යෝජකයින් | 228,926 | 66,350 | 28.98 |
| අරමුදලේ සාමාජක ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 13.6 | 2.3 | 16.91 |

2011 වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකාවේ සේවානියුක්තියේ ස්වයං රැකියා ලාභීන් 2,427,705 ක් විය. මෙම ස්වයං රැකියා ලාභීන්ගේ යහසාධනය වෙනුවෙන් අරමුදල ගත් ක්‍රියාමාර්ග කිසිවක් වාර්තා වී නොතිබුණි.
(ප්‍රභවය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2011)

(ආ) <u>සාමාජිකයන් වෙත ගෙවන ප්‍රතිලාභ</u>

| <u>වර්ෂය</u> | <u>2011</u> | <u>2010</u> | <u>2009</u> | <u>2008</u> | <u>2007</u> |
|---|---|---|---|---|---|
| | % | % | % | % | % |
| ගෙවන ලද ප්‍රතිලාභ ප්‍රතිශතය | 11.5 | 12.5 | 13.75 | 13.2 | 11.2 |

2011 වර්ෂයේ දී ආයෝජන ආදායම් රු. 5,049,303,683 කින් අඩුවීම හා සාමාජික අරමුදලේ රු. 110,734,645,618 ක වර්ධනය වීම 2010 වර්ෂයට වඩා 2011 වර්ෂයේ දී සාමාජිකයින් වෙත ගෙවන ප්‍රතිලාභ ප්‍රතිශතය සියයට 1 කින් අඩුවීමට හේතුවී තිබුණි.

### 3.1.2 <u>ආයෝජන හා ආයෝජන ආදායම්</u>

2011 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදල කොටස් වෙළෙඳපොළේ සමාගම් 74 ක දිගුකාලීනව හා කෙටිකාලීනව කර තිබුණු රු. 73,948,947,927 ක් වූ සමස්ත ආයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 ජනවාරි 15 දින වන විට සේවක අර්ථසාධක අරමුදල කොටස් වෙළෙඳපොළේ සමාගම් 76 ක කර තිබුණු රු. 63,169,398,923 ක දිගුකාලීන හා කෙටිකාලීන ආයෝජනවලින් සමාගම් 58 කට අදාල රු. 54,006,955,606 ක ආයෝජනවල වටිනාකම රු. 11,737,841,979 කින් අඩුවී තිබුණි.

(ආ) ගුවන් සමාගමක 2010 ජූලි මාසයේ දී කරන ලද ආයෝජනයකදී රු. 500,000,000 ක් ගෙවා මිලදී ගන්නා ලද ඒකක 1,863,676 ක් වෙනුවෙන් ආයෝජනය කළ දින සිට 2012 ජූනි 30 දින තෙක් කිසිදු ආදායමක් අරමුදලට ලැබී නොතිබුණි. "අලාභ ක්‍රම ක්‍රමයෙන් අඩුවන මෙම සමාගමෙන් අනාගතයේ ද ලාභ ලබා ගැනීමට හැකි බවට විශ්වාස කරන බව" මෙයට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දන්වා තිබුණි.

(ඇ) විදුලිය බල සමාගමක 2007 අප්‍රේල් මාසයේ සිට 2008 නොවැම්බර් මාසය දක්වා කාල සීමාව තුළදී ඒකක 29,750,000 ක ආයෝජනය කර තිබුණු රු. 2,975,000,000 ක් වෙනවෙන් අරමුදලට 2008, 2009 හා 2010 යන වර්ෂ වලදී කිසිදු ආදායමක් ලැබී නොතිබුණු අතර, 2011 වර්ෂයේ දී පමණක් දෙවරකදී ලාභාංශ ආදායම් ලෙස රු.540,909,091 ක් ලැබී තිබුණි. ආයෝජිත කාලසීමාවට අනුව ප්‍රතිශතයක් ලෙස මෙම ආදායම් ලැබීම වාර්ෂිකව සියයට 4 ක් පමණ විය. "2012 දී ලැබුණු රු. 216,363,636 ක ආදායම ද සමග මෙම සමාගමෙන් ලැබුණු වාර්ෂික ආදායම් ප්‍රතිශතය සියයට 4.9 දක්වා වර්ධනය වී තිබුණු අතර, මෙම සමාගම සැලකිය යුතු ලාභ උපයන මට්ටමක පවතින නිසා 2013 වර්ෂයේදී ප්‍රමාණවත් ලාභාංශයක් අරමුදලට ලැබීමේ හැකියාවක් පවතින බව" මෙයට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දන්වා තිබුණි.

(ඈ) 2011 පෙබරවාරි 23 සිට 2011 නොවැම්බර් 01 දක්වා වූ කාල සීමාව තුළදී එක්තරා මූල්‍ය සමාගමක කොටස් 5,091,200 ක රු. 205,489,613 ක් ආයෝජනය කර තිබුණු අතර, එසේ ආයෝජනය කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවේ දී එම සමාගම විසින් අවසාන වරට ප්‍රකාශිත ගිණුම් වලින් අනාවරණය වූ රු. 4,285,937,284 ක් අලාභයක් ලබා තිබීම පිළිබඳව සලකා බලා නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදීද මෙම සමාගම ලබා තිබුණු අලාභය රු. 3,830,135,175 ක් විය. මෙම සමාගමේ කොටසක් රු. 40.36 සාමාන්‍ය මිලක් යටතේ මිලදී ගෙන තිබුණු අතර, 2012 ජූලි 31 දින වන විට

මෙහි කොටසක වෙළෙඳපොළ අගය රු. 24 ක් විය. මෙම ආයෝජනයෙන් ආයෝජනය කළ දින සිට කිසිදු ආදායමක් අරමුදලට ලැබී නොතිබුණි.

(ඉ) අරමුදල රු. 680,232,419 ක් වැය කර සන්නිවේදන සමාගමක කොටස් 20,942,989 ක් මිලදී ගෙන තිබුණු අතර, එම කොටස් 2009 වර්ෂයේ සිට කොටස් වෙළෙඳපොළේ ගනුදෙනු සඳහා යොදවා නොතබීම නිසා ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට අරමුදලට නොහැකි වී තිබුණි. මෙම ආයෝජනයෙන් අදාල කාල සීමාව තුළදී එනම්, 2008 හා 2009 වර්ෂවලදී සියයට 3.39 ක් බැගින් ද, 2010 වර්ෂයේදී සියයට 0.81 ක් හා 2011 වර්ෂයේදී 1.67 ක් වශයෙන් ලාභාංශ ආදායම් ලැබී තිබුණද, එම ආදායම කරන ලද ආයෝජනයට ප්‍රමාණවත් නොවුණි. "ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රමවේදය තුළ සන්නිවේදන ක්ෂේත්‍රය තවදුරටත් වර්ධනය වන බැවින් අනාගතයේ දී මෙම සමාගමෙන් අරමුදලට ලැබෙන ලාභාංශ හා ප්‍රාග්ධන ලාභ ඉහල යන බවට විශ්වාසයක් පවතින බව" මෙයට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දන්වා තිබුණ.

(ඊ) සේවක අර්ථසාධක අරමුදල විසින් 2008, 2009, 2010 හා 2011 වර්ෂවලදී පිළිවෙලින් රු. 3,890,902,522, රු. 6,877,822,908 , රු. 39,133,587,926 හා රු.73,948,947,927 කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කර තිබුණි. එම ආයෝජනය සඳහා ලැබී තිබුණු ආදායම 2008, 2009, 2010 හා 2011 වර්ෂවලදී පිළිවෙලින් සියයට 8.94 ක්ද, සියයට 24.18 ක්ද, සියයට 6.84 ක්ද, සියයට 4.08 ක්ද වී තිබුණි.

(උ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ දී සමාගම් 11 ක කොටස් වෙළෙඳපොළේ කර තිබුණු රු. 3,555,864,821 ක ආයෝජනය සඳහා සේවක අර්ථසාධක අරමුදලට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් හෝටල් හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ ආයෝජනය වැඩි කිරීමට දෙන ලද උපදෙස් ප්‍රකාරව, 2010 දෙසැම්බර් 31 දින වන විට හෝටල් සමාගම් 18 ක රු. 3,882,771,148 ක් හා 2011 දෙසැම්බර් 31 දින වන විට හෝටල් සමාගම් 16 ක රු. 7,219,711,548 ක් ද, වශයෙන් මුදල් ආයෝජනය කර තිබුණි. 2010 දෙසැම්බර් 31 දිනට වූ ආයෝජනය සඳහා 2011 වර්ෂයේ දී රු. 50,807,109 ක් හෙවත් ආයෝජනයට සියයට 1.31 ක් ද, 2011 දෙසැම්බර් 31 දිනට වූ ආයෝජනය සඳහා 2012 වර්ෂයේ දී රු. 173,616,783 ක් හෙවත් ආයෝජනයට සියයට 2.4 ක් ද, වශයෙන් ආදායම් ලැබී තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ 2010 මැයි 05 දින ගත් තීරණය පරිදි 2007, 2008, 2009 හා 2010 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 520.49, රු.මිලියන 405.38, රු.මිලියන 298.85 හා රු.මිලියන147.02 ක් අලාභ ලැබීම හා එම වර්ෂයන් තුළ පිළිවෙලින් (3.15), (3.45), (1.9) හා 0.13 ක් ලෙස ඉපයීම් අනුපාතය අවාසිදායක මට්ටමක පැවති හෝටල් සමාගමක රු.810,321,610 ක් 2010 මැයි 31 දින වන විට ආයෝජනය කර තිබුණි. එදින වනවිට මෙම සමාගම ගෙවිය යුතුව තිබූ ණය මුදල රුපියල් බිලියන 6.28 කට ආසන්න විය. අදාල ආයෝජනය සිදු කරන ලද දින සිට 2013 ජුනි 30 දින තෙක් මෙම සමාගමෙන් කිසිදු ආදායමක් අරමුදලට ලැබී නොතිබුණි. "කොළඹ නගරයේ කේන්ද්‍රීය ස්ථානයක පිහිටා ඇති මෙම හෝටල් සමාගමට සංචාරක ක්ෂේත්‍රයේ සිදුවන වර්ධනය තුළින් වැඩි ප්‍රතිඵල ලබා ගැනීමක් අපේක්ෂා කල හැකි බව" මෙයට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව දන්වා තිබුණි.

(ii) අරමුදල විසින් රු. 1,129,755,045 ක් ආයෝජනය කර තිබුණු තවත් හෝටල් සමාගම් 02 කින් 2011 හා 2012 වර්ෂයන්හිදී කිසිදු ආදායමක් අරමුදලට ලැබී නොතිබුණි. "මෙම ආයෝජනයන් සංචාරක ක්ෂේත්‍රයේ සිදුවන වර්ධනයත් සමග ඇතිවන ප්‍රතිලාභ අරමුණු කරගෙන දිගුකාලීන ආයෝජන කළඹේ සිදුකල ආයෝජනයන් බවත් මෙම ආයෝජනයන් ඉදිරි වසර වලදී අරමුදලට වැඩි ප්‍රතිලාභ අත්කරදෙනු ඇති බවත් " මෙයට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව දන්වා තිබුණි.

(iii) 2011 දෙසැම්බර් 31 දිනට හෝටල් සමාගම් 04 ක කර තිබුණු ආයෝජනයෙන්, ප්‍රමාණවත් නොවන ආදායමක් ලැබී තිබුණු අතර, එම ආදායමේ ප්‍රතිශතයන් පෙර වර්ෂය සමග සසඳා පහත දක්වා ඇත.

| හෝටල් සමාගම | 2011.12.31 ආයෝජනය | ආදායම | ආදායමේ ප්‍රතිශතය | 2010.12.31 ආයෝජනය | ආදායම | ආදායමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | (රු) | (රු) | % | (රු) | (රු) | % |
| A | 702,115,954 | 14,699,144 | 2.09 | 302,991,992 | නැත | - |
| B | 54,108,598 | නැත | - | 54,310,045 | 105,715 | 0.19 |
| C | 4,183,849 | 60,700 | 0.01 | 4,183,849 | 36,420 | 0.87 |
| D | 182,268,900 | 482,761 | 0.26 | 194,331,840 | 1,707,868 | 0.88 |
| **එකතුව** | **942,677,301** | **15,242,605** | **1.62** | **555,817,726** | **1,850,003** | **0.33** |

(iv) අරමුදල විසින් 2012 ජුනි 30 දින වනවිට රු. 7,560,267,157 ක් ආයෝජනය කර තිබුණු ඉහත කී හෝටල් සමාගම් 16 න් සමාගම් 13 ක කොටස්වල වෙළෙඳපොළ අගය රු. 1,605,197,185 කින් අඩුවීම නිසා එම සමාගම්වල කොටස් අලෙවි කිරීමෙන් ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමේ අවධානමක් පැවතුණි. "සංචාරක ව්‍යාපාරයේ ප්‍රගතිය දෙස බලන කළ කොටස් වෙළඳපොළ නැවත යථා තත්ත්වයට පැමිණීමත් සමග සියළුම හෝටල් සමාගම් වල කොටස් මිළ ඉහළ යැමක් අපේක්ෂා කළ හැකි බව" මෙයට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව දන්වා තිබුණි.

(v) 2011 දෙසැම්බර් 31 දින රු.127,412,780 ක් ආයෝජනය කර තිබුණු හෝටල් සමාගමකන් 2011වර්ෂයේ දී කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

(එ) සේවක අර්ථසාධක අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනට නිල ලැයිස්තුගත සමාගම් 65 ක කර තිබුණු සමස්ත දිගුකාලීන ආයෝජනය රු. 73,122,216,934 ක් විය. එම ආයෝජනයෙන් රු. 58,349,901,901 ක් සමාගම් 21 ක ආයෝජනය කර තිබුණු අතර, එම සමාගම්වල ආයෝජනය සඳහා 2012 වර්ෂයේ දී සියයට 0.37 ක සිට සියයට 8.79 ක පාරාසයක් තුළ වූ ආදායම් ප්‍රතිශතයක ලැබී තිබුණි.

(ඒ) කොටස් වෙළෙඳපොළ කොටස් මිල සීඝ්‍ර පසුබැමකට ලක්ව තිබියදීත් 2011 දෙසැම්බර් 31 දින සිට 2012 ජුනි 30 දින දක්වා කාලසීමාව තුළදීත් සමාගම් 43 ක නව ආයෝජන ලෙස කොටස් 111,742,387 ක් මිලදී ගැනීම සඳහා රු. 3,657,803,132 ක් ආයෝජනය කර තිබුණි. 2012 ජුනි 30 දින වන විට එම සමාගම් වලින් සමාගම් 30 ක කොටස් මිල අඩුවීම නසා සිදුවී තිබුණු උපලබ්ධි නොවූ අලාභය රු. 340,768,531 ක් විය. මෙම සමාගම් වලින් සමාගම් 24 ක් 2011 දෙසැම්බර් 31 දිනට වන විට ද කොටස් වෙළෙඳපොළේ කොටස් මිල පහල වැටී තිබූ සමාගම් විය. "දිගුකාලීන ආයෝජනය සඳහා කොටස් වෙළෙඳපොළේ උපලබ්ධි නොවූ ලාභ හෝ අලාභ පිළිබඳව සලකා බැලීම යෝග්‍ය නොවන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස වන බව" මෙයට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව දන්වා තිබුණි.

(ඔ) සේවක අර්ථසාධක අරමුදලේ 2011 දෙසැම්බර් 31 වන දිනට රු. 73,948,947,927 ක් ආයෝජනය කර තිබුණු සමාගම් 74 කින් 2012 මාර්තු 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාගම් 07 ක් අලාභ ලබා තිබුණු අතර, එම සමාගම් වල කර තිබුණු අරමුදලේ ආයෝජනය රු. 1,711,538,303 ක් වී තිබුණි. ඉතිරි සමාගම් 71 ක 2011/12 වර්ෂය සඳහා ලාභ ලබා තිබුණ ද, ලාභාංශ ප්‍රකාශ කර තබුනේ එම සමාගම් වලින් සමාගම් 66 ක පමණි. 2012 වර්ෂයේ උ එම සමාගම් විසින් ප්‍රකාශිත සේවක අර්ථසාධක අරමුදල විසින් ලැබූ ලාභාංශය රු. 1,638,242,546 ක් විය. මෙම ලාභාංශ ආදායමේ ප්‍රතිශතය ආයෝජිත මුදලට සියයට 2.21 ක් වී තිබුණි.

**(ඕ)** 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 5 (ඇ) වගන්තියෙන් පැවරී ඇති අරමුදලේ භාරය දැරීම හා 5 (ඉ) වගන්තියෙන් අතිරික්ත මුදල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී පනතේ 4 (1) වගන්තියෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල හා පනතේ 5 (ඕ) වගන්තියෙන් අදාල ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල පිළිබඳව ද සලකා බලා රු.987,966,359,597 ක් වූ ආයෝජන කටයුතුවලදී ඔවුන්ගේ නියෝජනයන්ද ලබා ගැනීමේ වැදගත්කම පිළිබඳව අවධාරණය කරනු ලැබේ.

3.2 ආර්ථික නොවූ ගනුදෙනු

අරමුදලේ කාර්යයන් සඳහා ආකෘති පත්‍ර මුද්‍රණය කිරීමට 2008 වර්ෂයේ දී රු. 21,884,084 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණත්, ආකෘති පත්‍ර මුද්‍රණය සඳහා 2011 වර්ෂයේදී ද රජයේ මුද්‍රණාලය වෙත රු. 4,487,163 ක් ගෙවා තිබුණි.

3.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු 2010 වර්ෂයේ දී ආරම්භ කර ගොඩනැගිල්ලේ මූලික වැඩ වෙනුවෙන් 2010 හා 2011 වර්ෂවලදී පිළිවෙලින් රු. 48,702,131 ක් හා රු. 263,947,069 ක් වශයෙන් එකතුව රු. 312,649,200 ක් වැය කර තිබුණි. එසේ වුවද, මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා තිබුණි. 2011 වර්ෂයේ දී ගොඩනැගිලි කුලී වෙනුවෙන් රු. 71,257,404 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවා තිබුණි.

3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදලේ පවතින පහත සඳහන් පුරප්පාඩු 117 ක් පිරවීමට 2012 දෙසැම්බර් 31 දින වන විට ද නොහැකි වී තිබුණි.

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 30 | 19 | 11 |
| මාණ්ඩලික නොවන ශ්‍රේණිය | 188 | 100 | 88 |
| කණිෂ්ඨ ශ්‍රේණි | 42 | 24 | 18 |
| **එකතුව** | **260** | **143** | **117** |

- "පුරප්පාඩු පිරවීමට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර තිබුණත්, නිලධාරීන් ලබා නොදම හේතුවෙන් මෙම පුරප්පාඩු පවතින බව" මෙයට පිළිතුරු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් දන්වා තිබුණි.

**(ආ)** කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදලේ වියදම් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ වියදම් පාර්ලිමේන්තුවේ අනුමැතියකට යටත් නොවීමත් නිසා, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩල පිරිවැය වශයෙන් 2011 වර්ෂයේ දී රු. 214,714,011 ක් වැය කර තිබුණි. නමුත් කාර්යභාරයන් 13 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලය මගින් ඉටු කරවා නොගෙන බාහිර පාර්ශවයන් 11 ක් මගින් එම කාර්යයන් ඉටු කරවාගෙන තිබුණු අතර, ඒ සඳහා 2011 වර්ෂයේ දී රු. 42,149,957 ක් ගෙවා තිබුණි. මෙසේ බාහිර පාර්ශවයන් ලවා ඉටු කරගනු ලබන කටයුතු කිහිපයක් මගින් අරමුදලේ රහස්‍යභාවයට බලපාන තොරතුරු එම පාර්ශවයන් අතට පත් වීමට ඉඩ ප්‍රස්තා පවතින බවට ද නිරීක්ෂණය විය.

## 4. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

### 4.1 <u>සංයුක්ත සැලැස්ම</u>

කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකස් කරන ලද 2013 - 2017 සංයුක්ත සැලැස්මේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ද අන්තර්ගත වී තිබුණි.

### 4.2 <u>අභ්‍යන්තර විගණනය</u>

අරමුදල ක්‍රියාවේ යෙදවීමට අදාල අභ්‍යන්තර විගණනය කම්කරු දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන අතර, සේවක මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා අරමුදලේ සීමිත කොටසක් පමණක් එම විගණනයෙන් ආවරණය වී තිබුණි.

අරමුදල් පාලනයට අදාල අභ්‍යන්තර විගණනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෞද්ගලික විගණන සමාගමකට පවරා දී තිබුණු අතර 2011 වර්ෂයේ දී ගෙවා තිබුණු විගණන ගාස්තුව රු. 7,314,048 ක් විය.

### 4.3 <u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම</u>

නියමිත පරිදි කම්කරු අමාත්‍යාංශය හා කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදලේ විගණන හා කළමනාකරණ කමිටු පවත්වා තිබුණු අතර, මෙම කමිටු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ සහභාගිත්වයක් නොතිබුණි.

## 4.4 <u>නොවිසඳී ඇති විගණන ජේද පිළිබඳ නිරීක්ෂණ</u>

2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ නොවිසඳුණු විගණන ජේද පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** එක්තරා සේවායෝජක ආයතනයක් විසින් සිය සේවකයන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල වෙත එවන ලද රු. 3,608,667 ක දායක මුදල් ව්‍යාජ සී වාර්තා මගින් තම ඥාතීන් ගේ පෞද්ගලික ගිණුම් වලට බැරකර ගත් කම්කරු නිලධාරියකුගෙන් නීති මගින් අදාල මුදල් අයකර ගත්තද, ඔහුට එරෙහිව පැවැත්වෙන විනයානුකූල ක්‍රියාමාර්ග 2013 ජුනි 30 දින වනවිටත් නිම කර නොතිබුණි. ( 2006 - 2.5 (අ) )

**(ආ)** 1995 - 2003 දක්වා වූ කාල සීමාව තුල අවසන් වූ නඩු වලින් මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය මගින් අයකළ රු. 16,803,661 ක දායක මුදල් හා අධිභාර මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලැබී නොතිබුණි. ( 2006 - 2.5 (ආ) )

**(ඇ)** 1994 ජනවාරි 31 දින සමාගමක් ලෙස ලියාපදිංචි කළ 1997 අප්‍රේල් 01 දින ව්‍යාපාර කටයුතු ආරම්භ කළ මූල්‍ය සමාගමක් 1997 දෙසැම්බර් 03 දින සේවක අර්ථසාධක අරමුදලට දායක වී තිබුණි. එම සාමගම සේවක දායක මුදල් හා අධිභාර රු. 48,461,705 ක් හිඟව තිබියදී ඈවරකරණයට ලක් වී තිබුණි. 2012 දෙසැම්බර් 31 දින වන විටත් මෙම මුදල් අයකරගැනීමට සේවක අර්ථසාධක අරමුදලට නොහැකි වී තිබුණි. "ආයතනයට නඩුවක් පවරා ඇති බවත් එම ආයතනය කම්කරු කොමසාරිස්ට එරෙහිව නඩුවක් පවරා ඇති බවත් " මෙයට පිළිතුරු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් දන්වා තිබුණි. ( 2008 - 2.2.6 (ඉ) I)

**(ඈ)** රූපවාහිනී ආයතනයක් 2007 සැප්තැම්බර් 02 දින දක්වා සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම පිළිබඳව පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. එසේ තිබියදී එම ආයතනයේ නීතිමය අවශ්‍යතා ඉටුකර ගැනීමට සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම ගැටලුවක් වී තිබූ බැවින් කම්කරු කාර්යාලයට ඉදිරිපත් වූ තොරතුරු අනුව 2007 සැප්තැම්බර් සිට 2008 මැයි සඳහා පමණක් හිඟහිටි දායක මුදල් හා අධිභාර රු.18,449,928 ක් අයකර ගැනීමට ආයතනයේ ඉල්ලීම පරිදි වාරික 20 කින ගෙවීම අනුමත කර තිබුණත් එම මුදල් 2013 ජුනි 30 දින වනවිටත් ගෙවා නොතිබුණි. ( 2008 - 2.2.6 (ඉ) II )

(ඉ) 2005 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළදී සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ගේ දායක හා අධිභාර වශයෙන් නඩු මගින් අයකළ රු. 62,571,668 ක් අදාල සාමාජිකයින් පිළිබඳව නිවැරදි තොරතුරු සේවක අර්ථසාධක අරමුදලේ නොමැති වීම නිසා එම මුදල් ඔවුන්ගේ පෞද්ගලික ගිණුම් වලට බැර නොකර රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.( 2010 - 2.2.1 (අ) I)

(ඊ) මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලීය බල ප්‍රදේශයට අයත් ආයතන වලින් දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට නඩු පවරා අධිකරණ ක්‍රියාමාර්ග නොගැනීම, නඩු පවරා තිබුණත් ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම, වාරික පහසුකම් ලබාදුන් ආයතන ඒවා ගෙවීම් පැහැර හැරීම, ආයතන ඇවර කිරීමට පෙර සේවක අර්ථසාධක අරමුදල් අයකර නොගැනීම, සේවක අර්ථසාධක අරමුදලේ අවිනිශ්චිත ගිණුමේ තැන්පත් කර ඇති මුදල් නිවැරදි "සී" වාර්තා ලබා දී නිරවුල් නොකිරීම, 2003 - 2006 කාල සීමාව තුළ ලැබී තිබූ දායක මුදල් හා අධිභාර නියමිත සාමාජික ගිණුම් වලට බැර නොකිරීම සහ ප්‍රමාද අධිභාර අයකර නොගැනීම හා සම්බන්ධ රු. 313,452,501 ක් පිළිබඳව වාර්තා කරන ලද විගණන විමසුමට හා එම කරුණු ඇතුළත් කරන ලද 2009 විගණකාධිපති වාර්තාවේ 3.2.5 ඡේදයේ (ඇ) හා 2010 විගණන වාර්තාවේ 3.2.1 (ඇ) (iii) වගන්ති වලින් දක්වන ලද කරුණු වලට විමර්ශනය කර පිළිතුරු සපයන බව දක්වා තිබුණ ද ඒ පිළිබඳව 2012 දෙසැම්බර් 31 දින දක්වා ද පිළිතුරු සපයා නොතිබුණි.

## 5. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති පාලන වල අඩුපාඩු කම්කරු කොමසාරිස් ජනරාල් සහ අධිකාරී, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

## 5.1 <u>ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව</u>

(අ) ආයෝජන

(ආ) මෙහෙයුම් කටයුතු බාහිර පාර්ශවයන්ට පැවරීම

(ඇ) විගණනය සඳහා තොරතුරු සැපයීම

## 5.2 <u>කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය</u>

(අ) ගිණුම්කරණය

(ආ) විගණන ප්‍රමිත අනුගමනය කිරීම

(ඇ) දායක හා අධිභාර මුදල් අයකර ගැනීම

(ඈ) ස්ථාවර වත්කම්

(ඉ) සේවායෝජක ආයතන පරීක්ෂාව